# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1775/7 - 2012 සැප්තැම්බර් මස 11 වැනි අඟහරුවාදා - 2012.09.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත

### මධ්‍යම පළාතේ පළාත් සභාවේ මන්ත්‍රී ධුරයක පුරප්පාඩු පිරවීම

මධ්‍යම පළාතේ පළාත් සභාවේ මන්ත්‍රීවරයකු මියයාම හේතුකොට ගෙන එම පළාත් සභාවේ මන්ත්‍රී ධුරයක පුරප්පාඩුවක් ඇති වී තිබෙන බව 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 65(1) වැනි වගන්තිය යටතේ මධ්‍යම පළාතේ පළාත් සභාවේ ලේකම්වරයා විසින් මා වෙත දන්වා තිබෙන හෙයින් ද,

එකී පුරප්පාඩුව පුරවනු පිණිස තෝරා පත්කර ගත් මන්ත්‍රීවරයා අයත්ව සිටි පිළිගත් දේශපාලන පක්ෂය වන එක්සත් ජනතා නිදහස් සන්ධානය පක්ෂයෙහි ලේකම්වරයාට ඉහත කී පනතේ 65(2) වැනි වගන්තිය යටතේ සුදුසුකම් ඇති තැනැත්තෙකු නාමයෝජනා කරන ලෙස ම විසින් නියම කර ඇති හෙයින් ද,

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්වරයා විසින් එකී පුරප්පාඩුව පුරවනු පිණිස උජිත් අනුරාධ මහතා නාමයෝජනා කර ඇති හෙයින් ද ;

මැතිවරණ කොමසාරිස් මහින්ද දේශප්‍රිය වන මම, 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 65(2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියකරමින්, උජිත් අනුරාධ මහතා එම පුරප්පාඩුව සිදුවූ මාතලේ පරිපාලන දිස්ත්‍රික්කයේ ඉහත සඳහන් පළාත් සභාවේ මන්ත්‍රීවරයා ලෙස තේරී පත්වී ඇති බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

මහින්ද දේශප්‍රිය,
මැතිවරණ කොමසාරිස්.

2012 සැප්තැම්බර් මස 09 වැනි දින,
මැතිවරණ මහලේකම් කාර්යාලය,
රාජගිරිය.

09-841

1A - G 16582— 355 (2012/9)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.